සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**10 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** | **43 S I**

නම: ............................................ | **චිත්‍ර කලාව** | **කාලය පැය එකයි**

**ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
**පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.**



01) රූපයේ දැක්වෙන්නේ ක්‍රි.පූ. 2440 පමණ අයත් මූර්තිය ..................................................... කලාවට අයත් වේ.

(02) මෙම මූර්තිය ........................................................................................ නමින් හැඳින්වේ.

(03) මෙය මිනිස් මුහුණත් සමඟ ..................................................... ශරීරයෙන් බද්ධ කිරීමෙන් නිර්මාණය කර ඇත.

(04) මෙය ............................................ වරුන්ගේ බලපරාක්‍රමය නිරූපණය කිරීම සඳහා නිර්මාණය කර ඇත.

(05) මෙය මිසර මූර්ති කලාවේ ........................................... නිර්මාණයක් සඳහා කදිම නිදසුනකි.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

06. ''ඇත්දළ පාලම''නම් චිත්‍ර කතාව නිර්මාණය කරන ලද්දේ ................................................. ශිල්පියා විසිනි.

07. දෙවොල් මඩුව ශාන්තිකර්මය ................................................ නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්ති කර්මයකි.

08. ඉටි වාත්තු ක්‍රමය සහ ............................................ ක්‍රමය පාරම්පරික පිත්තල නිර්මාණ තුළ දැකිය හැකි ශිල්ප ක්‍රම වේ.

09. බුදු පිළිම වල දැකිය හැකි දෙබැම අතර දකුණට කැරකැවුණු මෘදු රෝමය ............................................... ලෙස හඳුන්වයි.

10. ජේතවන දාගැබෙහි බුදුන් වහන්සේගේ .................................................තැන්පත් කර ඇති බව සැලකේ.

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ලාක්ෂා කර්මාන්තයේ දී කහ වර්ණය ලබාගන්නේ,
    i. සාදිලිංගම් වලිනි. ii. නිල්අවරිය වලිනි. iii. කැකුණ දැලි වලිනි. iv. හිරිගල් වලිනි.


12. දඹුලු විහාරයේ දී බහුල ලෙස දැකිය හැකි උද්භිද ගණයේ මෝස්තරයකි.
    i. සීනමල ii. වැටකේ මල iii. කඩුපුල් මල iv. පිච්ච මල

13. යාපනයේ නල්ලූර් කන්දස්වාමි කෝවිලෙහි දක්නට ඇත්තේ,
    i. සිම්ම වාහනම් ය. ii. කුදිරෙයි වාහනම් ය. iii. මසද්ජම් ය. iv. තේර් රථය ය.

14. සුදු අත් සහිත පූජක රූපය හා ගණපති රූප සිතුවම දැකිය හැකි වූයේ,
   i. සට්ටනාදර් ශිව දේවාලයේ ය.   ii. ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිලෙහි ය.
   iii. කේක් කට්ටිම්චෝලෙයි ශිවම් කෝවිලෙහි ය.   iv. නල්ලූර් කන්දස්වාමි කෝවිලෙහි ය.

15. දිය සායම් මාධ්‍ය භාවිතයෙන් වර්ණ ගන්වන සිතුවමක තිබිය යුතු විශේෂ ලක්ෂණයක් වන්නේ,
   i. සුදු වර්ණය භාවිතයෙන් ආලෝකය දැක්වීමයි.   ii. තලය පුරා ඉතා දීප්තිමත් වර්ණ භාවිතා කිරීමයි.
   iii. විනිවිද පෙනෙන සේ ජලය සමඟ මිශ්‍ර වර්ණ භාවිතයයි.   iv. විවිධ වයනය සහිත වර්ණ පදාස තැවරීමයි.


- පහත අංක 16 සිට 20 **A,B,C,D,E** හි රූප ඇසුරින් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

16. A අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහණ දැකිය හැකි ස්ථානය නම් කරන්න.

.......................................................................................................

17. B අක්ෂරයෙන් දැක්වෙන දේව ප්‍රතිමාව (සුමන සමන් දෙවියන්) දැකිය හැකි ලෙන් විහාරය නම් කරන්න.

.......................................................................................................

18. C අක්ෂරයෙන් දැක්වෙන වර්ණ ගන්වන ලද සිතුවම හමුවන ස්ථානය කුමක්ද?

.......................................................................................................

19. D අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිමවා ඇති මාධ්‍ය නම් කරන්න.

.......................................................................................................

20. E අක්ෂරයෙන් දැක්වෙන සැරසිලි අංගය භාවිතයට ගැනෙන ශාන්තිකර්මය කුමක්ද?

.......................................................................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වන සේ අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.

21. භද්‍රාසන - .......................................................

22. ඔන්ඩිප්පායි - .......................................................

23. අල්පනාව - .......................................................

24. ස්ක්‍රයිබ් - .......................................................


25. මොනෝ ක්‍රෝම් - .......................................................

- ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවයක් දක්වන රූපසටහන ඉදිරියෙන් ඇති **A, B,C,D,E** යන රූප සටහන් අතුරෙන් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

26.  ..............................................

27.  ..............................................

28.  ..............................................


29.  ..............................................


30.  ..............................................

A 

B 

C 

D 

E 

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා හිස්තැනට සුදුසු පිළිතුරු ලියන්න.


31. "ඇතා වල්ලිව එළවාගෙන යාම" නම් එනමල් වර්ණයෙන් වර්ණ ගන්වා ඇති සිතුවම .............................................. ශිල්පියාගේ නිර්මාණයකි.

32. දෙගල්දොරුව රජ මහා විහාරයෙහි සිතුවම් ඇඳි ප්‍රධාන ශිල්පියා ලෙස .............................................. පිළිගැනේ.

33. මේලෝ දිවයිනෙන් සොයාගත් "වීනස් ඩී මේලෝ" නම් මූර්තිය .............................................. ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.

34. හස්තියා, සිංහයා, අශ්වයා යනාදී සතුන්ගේ කොටස් යොදාගෙන හින්දු කෝවිල් වල බහුලව භාවිතා වන නිර්මාණයක් ලෙස .............................................. හැඳින්විය හැකි ය.

35. රූපාක්ෂර හෙවත් .............................................. මිසර කලාව ආශ්‍රිතව දැකිය හැකිය.



36. හඳුනාගත් බව - ........................................................................................................

37. තේමාව - ........................................................................................................

38. සංරචනය - ........................................................................................................

39. වර්ණ භාවිතය - ........................................................................................................

40. ශෛලී ලක්ෂණ - ........................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S III

නම: ..........................................

**චිත්‍ර කලාව**

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි.

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය, පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටෙහි පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළිව තිබිය යුතුය.
- දිය සායම්, පෝසටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (මකන දියර භාවිතය සුදුසු නැත.)
  ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේදී පමණි.)
  (පළාත් මට්ටමේ තමන් විසින් සපයා ගත යුතුය.)

- පහත දැක්වෙන (අ), (ආ) හෝ (ඉ) කොටස් වලින් ඔබ කැමති එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

(අ) කොටස - චිත්‍ර සංරචනය
01. ජන ක්‍රීඩාවක ඔබ සිත්ගත් අවස්ථාවක්
02. නගරයේ වීදියක රිය අනතුරක්
03. ආගමික සිද්ධස්ථානයක් පිරිසිදු කරන බැතිමතුන්
04. නිදහසේ වනයේ සැරිසරන වන අලි රංචුවක්

(ආ) කොටස - මෝස්තර නිර්මාණය
01. 20cm × 20cm ප්‍රමාණයේ චතුරස්‍රාකාර හැඩයෙන් යුත් කුෂන් කවරයකට සුදුසු මුළුතල මෝස්තරයක් වර්ණවත්ව නිම කරන්න.
02. අරලිය මල් සහ කොළ නිර්මාණාත්මකව යොදා ගනිමින් චීත්ත මෝස්තරයක් සඳහා සුදුසු ව්‍යාප් මෝස්තරයක් නිර්මාණය කරන්න.
03. සාරි බෝඩරයට උචිත මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

(ඉ) කොටස - ග්‍රැෆික් කොටස
01. ඔබ විද්‍යාලයේ සාහිත්‍ය උත්සවය සඳහා ආරාධනා පත්‍රයක් වර්ණවත්ව නිම කරන්න.
02. ''ජලය සුරකිමු'' යන තේමාව විග්‍රහ වන අයුරින් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
03. ළමා කතන්දර පොතක් සඳහා සුදුසු පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.



(6) www.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S II

නම: ............................................ | **චිත්‍ර කලාව** | කාලය පැය දෙකයි

## නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට
1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිතා කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ කඩදාසිය භාවිත කරන්න.

- මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාරදෙන්න.
- ඔබේ චිත්‍රය ඇඳීමේදි පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- රේඛා අධ්‍යයනය

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යනයේදී දක්වා ඇති කුසලතා

- වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
3. සිද්ධාන්ත භාවිතය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහය මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
5. වර්ණ හැසිරීමේ කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ථ නිමාව

සැලකිය යුතුයි :
ද්‍රව්‍යය සමූහය තබා ඇති ලැල්ල විශාල ලෙස ඇඳීම අදාල නොවේ. ලෑලේලේ ප්‍රමාණය ද්‍රව්‍යය සමූහයට ගැලපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

PAST PAPERS WIKI


(6) www.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!

## පිළිතුරු

01. ඊජිප්තු
02. ස්පීනින්ස්
03. සත්ව / සිංහ
04. පාරාවෝ
05. කල්පිත
06. ජනක රත්නායක
07. පහතරට
08. පස්වාත්තු
09. ඌර්ණ රෝමය
10. පටිධාතුව
11. IV
12. I
13. II
14. I
15. III
16. පොළොන්නරුව වටදාගෙය
17. දඹුලු ලෙන් විහාරය
18. තීබස්වල කොබාමූන් සොහොන් ගැබ
19. කිරිගරුඬ
20. පහන් මඩුව ශාන්තිකර්මය
21. මෙය ආයක චතුරස්‍රාකාර හැඩයක් ගත් නිර්මාණයකි.
22. මඩකලපු පන් පැදුරු රටාවකි.
23. පහනක යට කොටසෙහි සැරසිලි සඳහා භාවිතා කරයි.
24. ඊජිප්තු මූර්ති කලාවේ මූර්තියකි.
25. එකම වර්ණයේ ප්‍රභේද වලින් අඳින සිතුවම්ය.
26. D
27. C
28. E
29. A
30. B
31. පෙරියතම්බි සුබ්‍රමණියම්/ පෙ. සුබ්‍රමණියම්
32. දෙවරගම්පල සිල්වත්තැන
33. ඇලෙක්සැන්ඩ්‍රෝස් (Alexanrors)
34. යාලි රුව
35. හයිරොග්ලිෆික්ස්
36. මෙය දෙගොල්දොරුව රජමහා විහාරයේ සිතුවමකි.
37. මාර පරාජය නිරූපණය වේ.
38. අඛන්ඩ කථන ක්‍රමයට සංරචනය කර ඇත.
39. ද්වීමාන පැතලි වර්ණ භාවිතය/ කහ, කොළ, රතු, කළු, සුදු ආදි වර්ණ භාවිතය
40. 18 වැනි සියවසට අයත් මහනුවර චිත්‍ර සම්ප්‍රදායෙන් ඇඳ ඇත.


(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 43 S II

## චිත්‍ර කලාව

ශාලාධිපතිට උපදෙස් :
- පහත දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය සම්පිණ්ඩනය කරන්න.
- ඇස් මට්ටමින් පහළ සිටින සේ ද්‍රව්‍ය සමූහය තබන්න.
- යෝජිත ද්‍රව්‍ය :

01. සනකයක් (45 cm × 24cm × 15 cm)
02. මැටි කළයක්
03. වතුර පිරවූ වීදුරු බෝතලයකට දැමූ කොළ පහක් සහිත ක්‍රෝටන් අත්තක්.
04. මල් සහිත චිත්‍රිත රෙදිකැබැල්ලක්.



PAST PAPERS WIKI



(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න